# මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ විශ්වවිද්‍යාලවල හා ඊට අනුබද්ධ උසස් අධ්‍යාපන ආයතනවල **තනතුරෙහි ස්ථිර කරන ලද සේවකයින්ගෙන් පමණක්** අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් තම සේවය කරන ආයතනයේ ලේකම්/ලේඛකාධිකාරී/මණ්ඩපාධිපති/අධ්‍යක්ෂ මගින් **2019.08.22 වෙනි දින හෝ ඊට පෙර ලැබෙනසේ ලේඛනගත තැපෑලෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී/ ආයතන (අනධ්‍යයන) වෙත ලැබීමට සැලැස්විය යුතුය.**

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. කිසියම් අයදුම්පතක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි එය සලකා බලනු නොලැබේ.

කොමිෂන් සභා චක්‍රලේඛ අංක 692 විධිවිධාන අනුව වෘත්තීය/යෝග්‍යතා/ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතාවය පදනම් කරගෙන සුදුස්සන් බඳවාගනු ලැබේ.

## 01. පරිපාලක (සිවිල්) III ශ්‍රේණිය

අවශ්‍ය සුදුසුකම්: I (අ) ජාතික තාක්ෂණ සහතිකය හෝ සමාන සුදුසුකම් සමග අවුරුදු 03 ක පළපුරුද්දක් ලබා තිබීම. (තුන් අවුරුදු පළපුරුද්ද ජාතික තාක්ෂණ සහතික පාඨමාලාව හැදෑරීමේ කාලය තුලදී ලබා තිබීම ප්‍රමාණවත් වේ.)

හෝ

(ආ) දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් විෂයයන් 06 කින් සමත්ව තිබීම හා රජයේ දෙපාර්තමේන්තුවක, පළාත් පාලන ආයතනයක, සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පරිපාලකවරයකු වශයෙන් අවුරුදු 05 ක පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් ක්‍රමය : රු.31,625-7x300;10x355-37,275-(මාසික) U-MT 1(III )
(17/2016(v) චක්‍රලේඛයේ 2020 වර්ෂයට අදාලව)

මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනුමත අනෙකුත් දීමනාවන් ද ගෙවනුලැබේ.

02. <u>වඩු කාර්මික (11 ශ්‍රේණිය) තනතුර</u>

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | (1) | කියවීමට හා ලිවීමට හැකියාව තිබිය යුතුය. |
| | (11) (අ) | ගොඩනැගිලි සහ ගෘහ භාණ්ඩ තැනීමේ කර්මාන්තයෙහි උපයෝගී කර ගනු ලබන පිරිද්දුම් පිළිබඳ දැනීම හා ඒවා සකස් කිරීම පිළිබඳ දැනීම. |
| | (ආ) | නොයෙකුත් අන්දමේ වඩු වැඩ සඳහා ආවුද පාවිච්චිය, විවිධ දැව වර්ග පිළිබඳ දැනීම හා වඩුවැඩ කර්මාන්තයට අදාළ චිත්‍ර කියවීම පිළිබඳ දැනීම. |
| | (ඇ) | අඟලෙන් 1/32 පරිමාණයන් නිවැරදිව කියවීමේ හැකියාව. |
| | (111) | වඩු කර්මාන්තය පිළිබඳ අවුරුදු 02 කට නොඅඩු පළපුරුද්දක් තිබීය යුතුය. |
| සටහන: | | 07 වැනි ප්‍රමාණය සමත් වූවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| වැටුප් ක්‍රමය: :- | | රු.27,062-16x244-30,966 (මාසික) U-PL 3 (III) (2019 වර්ෂයට අදාලවේ.)<br>රු.29,915-16x270-34,235 (මාසික) (2020 වර්ෂයට අදාලවේ) |

මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනුමත අනෙකුත් දීමනාවන් ද ගෙවනුලැබේ.

ලේඛකාධිකාරී
මොරටුව විශ්වවිද්‍යාලය
මොරටුව

2019.08.05